# රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
அரச சேவைகள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Services, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | COMBINED SERVICES DIVISION

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය தொலைபேசி: (94) 011- 2694560 Telephone
ෆැක්ස් தொலைநகல்: (94) 011- 2692254 Fax
ඊ-මේල් மின்னஞ்சல்: dgcs@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය இணைத்தளம்: www.pubad.gov.lk Web Site


මගේ අංකය / எனது இல / My No: CS/DOS/Policy/පොදු/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.10.16

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

## 2020.01.01 දිනට පෙර සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම් ලද නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කිරීම සම්බන්ධ තොරතුරු කැඳවීම

2020.01.01 දිනට පෙර පත්වීම් ලැබූ සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන පත්වීම ස්ථිර කිරීම සඳහා නිර්දේශ එවා ඇති නමුත් මෙතෙක් පත්වීම ස්ථිර කර නොමැති ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්තව සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන්ගේ තොරතුරු මේ සමග අමුණා ඇති ආකෘතිය CS/DOS/Con/Inf/2020 (ඇමුණුම 1) ප්‍රකාරව සකස්කර එහි දෘඪ පිටපත් 2020.10.30 දිනට පෙර ලැබෙන සේ හා මෘදු පිටපත් (Microsoft Excel) විද්‍යුත් තැපැල් ලිපින adcs5-dos@pubad.gov.lk ඔස්සේ හැකි ඉක්මනින් මා වෙත ලැබීමට සලස්වන ලෙස කාරුණිකව දන්වමි. (මෙම ආකෘතිය http://www.pubad.gov.lk/ හි වෙනත් නිවේදන වෙතින් බාගත කළ හැකිය)

02. තවද, 2020.01.01 දිනට පෙර පත්වීම් ලැබ පරිවාස කාලය සම්පූර්ණ කර ඇති <u>එහෙත් පත්වීම ස්ථිර කිරීමට මෙතෙක් නිර්දේශ ඉදිරිපත් කර නොමැති නිලධාරීන්</u> සම්බන්ධව නිර්දේශ ඉදිරිපත් කිරීමේදී මේ සමග අමුණා ඇති ආකෘතිය CS/DOS/Con/App/2020 (ඇමුණුම 2) හි දක්වා ඇති උපදෙස් පරිදි අවශ්‍ය සියලුම ඇමුණුම් සහිතව ඉදිරිපත් කළ යුතු බව කාරුණිකව දන්වමි.

03. 2020.01.01 දින සිට සංවර්ධන නිලධාරී සේවයේ පත්වීම් ලැබූ නිලධාරීන්ගේ පත්වීම් ස්ථිර කිරීමේදී මගේ අංක PA/CS/POLICY/Guidelines හා 2020.08.24 දිනැති ලිපිය අනුව කටයුතු කරන ලෙසද එම ලිපියේ 03 ඡේදයේ උපදෙස් අනුව 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කර ඇති නිලධාරීන් සම්බන්ධව මාස 06 ක් ඇතුලත ඒකාබද්ධ සේවයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුව ඇති ලේඛන නොපමාව එවීමට කටයුතු කරන ලෙසද කාරුණිකව දන්වමි.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්